පරිගණක ජාලකරණය - 9 ශ්‍රේණිය

සැකසුම : G.P. මනෝරංගනී

පාසල : අම්/ගාමිණී මහා විද්‍යාලය, අම්පාර

➢ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පරිගණක ජාලකරණයේ අවාසියකි.

I. දත්ත හුවමාරුව II. විද්‍යුත් තැපැල
III. සම්පත් පොදුවේ භාවිතය IV. පරිගණක වෛරස්

02. රැහැන් සහිත ජාලකරණයේ දී භාවිතා වන මාධ්‍යයක් වන්නේ,

I. අධෝරක්ත කිරණ II. වයි - ෆයි III. ප්‍රකාශ තන්තු IV. රේඩියෝ තරංග

- පහත රූප සටහන භාවිතයෙන් 3, 4, 5 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



03. ඉහත රූප සටහනේ A ලෙස නම් කර ඇත්තේ,

I. සේවාදායකය II. පරිගණකය 3 III. ස්විචය IV. මුද්‍රණ යන්ත්‍රය

04. B හි සඳහන් උපකරණය වන්නේ,

I. සේවාදායකය II. පරිගණකය 3 III. ස්විචය IV. මුද්‍රණ යන්ත්‍රය

05. C ලෙස නම් කර ඇත්තේ ,

I. සේවාදායකය II. මුද්‍රණ යන්ත්‍රය III. පරිගණකය 3 IV. ස්විචය

06. පරිගණක ජාල ගත කිරීමේ මූලික අරමුණක් නොවන්නේ,

I. දත්ත සන්නිවේදනය කිරීම. II. මෘදුකාංග හවුලේ භාවිතය
III. දෘඩාංග හවුලේ භාවිතය IV. දත්ත වල ආරක්ෂාව

07. පරිගණක ජාලකරණයේ දී හවුලේ භාවිතා කළ හැකි පරිගණක උපාංගයක් වන්නේ ,

I. සංදර්ශකය II. මූසිකය III. යතුරු පුවරුව IV. සුපරීක්ෂණය

08. එක් පරිගණක ජාලයක් වෙනත් පරිගණක ජාලයකට හෝ අන්තර්ජාලයට සම්බන්ධ කිරීම සඳහා .... යොදා ගැනේ.

I. සේවාදායකය II. මං හසුරුව III. සේවාලාභී පරිගණක IV. අතුරු මුහුණත්

09. සම්පත් හවුලේ භාවිතය සඳහා උදාහරණයක් නොවන්නේ,

I. පණිවිඩ හුවමාරුව II. දෘඩාංග භාවිතය III. මෘදුකාංග භාවිතය IV. දත්ත හුවමාරුව

10. පරිගණක දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අතර සබඳතාවක් ගොඩ නැගීම සඳහා මැදිහත්කරු ලෙස ක්‍රියා කරයි.

I. සේවාදායකය II. ජාලකරණ කාඩ්පත III. RJ 45 සම්බන්ධකය IV. ස්විචය

➢ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. පරිගණක ජාලකරණය යනු කුමක්ද?

02. ජාලකරණයේ වාසි 03 ක් ලියන්න.

03. පහත වගුව සම්පූර්ණ කරන්න.

පරිගණක ජාල සම්බන්ධ කිරීමේ දී යොදා ගනු ලබන මාධ්‍ය	උදාහරණ
1.	1. 2.
1.	1. 2.

04. පරිගණක ජාල ගත කිරීමට අවශ්‍ය මූලික උපාංග 03 ක් ලියන්න.

05. සේවාදායක හා සේවාලාභී පරිගණක හඳුන්වන්න.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ සමාජය - 9 ශ්‍රේණිය

සැකසුම : G.P. මනෝරංගනී

පාසල : අම්/ගාමිණී මහා විද්‍යාලය, අම්පාර

➢ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. e - වාණිජ සේවාවක් වන්නේ,

I. මාර්ගගත සාප්පු සවාරිය
II. බිල්පත් ගෙවීමේ සේවා
III. රෝග හඳුනා ගැනීමේ උපකරණ
IV. අන්තර්ජාලය මඟින් තොරතුරු සොයා ගැනීම.

02. නව තාක්ෂණික උපාංග සහ සම්පත් භාවිතය සඳහා පහසුකම් තිබීම / නොතිබීම නිසා සමාජයේ ඇති වී ඇති බෙදීම .... වේ.

I. e – ඉගෙනුම
II. 3R සංකල්පය
III. විද්‍යුත් අපද්‍රව්‍ය
IV. අංකිත බෙදීම

03. විද්‍යුත් අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම සඳහා .... සංකල්පය යොදා ගැනේ.

I. e – ඉගෙනුම
II. e – රාජ්‍ය
III. 3R
IV. e – සෞඛ්‍ය

04. පරිගණක උපකරණ හැකි සෑම විටම අළුත් වැඩියා කර නැවත භාවිතා කිරීම,

I. Reduce වේ.
II. Reuse වේ.
III. Recycle වේ.
IV. Reproduction වේ.

05. විද්‍යුත් අපද්‍රව්‍ය නිසා ස්නායු ආබාධ ඇතිවීම, අක්මාවට හානි වීම .... ලෙස හැඳින්වේ.

I. සෙලනියම්
II. බෙරිලියම්
III. මර්කරි
IV. බේරියම්

06. " ආසනික් " රෝග තත්වය යනුවෙන් හඳුන්වන්නේ,

I. විද්‍යුත් අපද්‍රව්‍ය නිසා ශාරීරික දුර්වලතා ඇතිවීම.

II. විද්‍යුත් අපද්‍රව්‍ය නිසා හෘද හානිය ඇතිවීම.

III. විද්‍යුත් අපද්‍රව්‍ය නිසා පේශි දුර්වලතා ඇතිවීම.

IV. විද්‍යුත් අපද්‍රව්‍ය නිසා පිළිකා ඇතිවීම.

07. පරිගණක මෘදුකාංග නිර්මාණය කරන්නා .... ලෙස හැඳින්වේ.

I. මෘදුකාංග නිර්මාණ ශිල්පී   II. මෘදුකාංග තත්ව සහතික ඉංජිනේරු

III. මෘදුකාංග ඉංජිනේරු   IV. පද්ධති විශ්ලේෂක

08. වැඩසටහන් ක්‍රමලේඛක යනුවෙන් හැඳින්වෙන්නේ,

I. මෘදුකාංග කේත පරීක්ෂා කරන්නා

II. පරිගණක භාෂා භාවිත කරමින් වැඩසටහන් සම්පාදනය කරන්නා

III. වෙබ් අඩවි නිර්මාණය, සංවර්ධනය හා යාවත්කාලීන කරන්නා

IV. පරිගණක ජාල ස්ථාපනය, නඩත්තුව සිදු කරන්නා

09. පරිගණක දෘඩාංග වල ක්‍රියාකාරී කාලය අවසන් වූ විට හෝ එය භාවිතයෙන් ඉවත් කළ විට .... ලෙස සලකනු ලැබේ.

I. 3R ක්‍රමය   II. විද්‍යුත් අපද්‍රව්‍ය   III. e- වාණිජ   IV. අංකිත බෙදීම

10. විනාශකාරී විද්‍යුත් අපද්‍රව්‍යයක් නොවන්නේ,

I. ලෙඩ්   II. රසදිය   III. සංයුක්ත තැටි කවර   IV. මව් පුවරුව

➢ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. e- රාජ්‍යයේ සේවාවන් 04 ක් සඳහන් කරන්න.

02. "අංකිත බෙදීම" යන්න හඳුන්වන්න.

03. විද්‍යුත් අපද්‍රව්‍ය නිසා මිනිසාට වැළඳිය හැකි රෝගාබාධ 05 ක් ලියන්න.

04. 3R සංකල්පය හඳුන්වන්න.

05. පරිගණක ආශ්‍රිත රැකියා අවස්ථා 03 ක් ලියන්න.